**ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය - 2023**

**-----------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රීලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර, අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, ඊට සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම් ව ගිණුම්කරණ සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල ප්‍රකාශනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයට අනුව, මණ්ඩලයේ ප්‍රධාන ආදායම් මාර්ගය රජයේ ප්‍රදාන වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂය තුළ රු. 5,470,285 කින් හෝ සියයට 07 කින් අඩු වී තිබුණි. එසේම, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මුළු වියදම රු. 5,470,285 කින් හෝ සියයට 07 කින් අඩු වී තිබුණි. එකතුව රු. 49,014,373 ක් වූ කාර්ය මණ්ඩල පිරිවැය සහ ගොඩනැගිලි කුලිය සමාලෝචිත වර්ෂය සඳහා වූ මුළු වියදමෙන් සියයට 68.5 ක් නියෝජනය කර තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ මුළු වියදමෙන් සියයට 69 ට සාපේක්ෂව සුළු වශයෙන් අඩු වී තිබුණි. විස්තර පහත සඳහන් පරිදි වේ.

| අයිතමය | වර්ෂය සඳහා | | වැඩිවීම / (අඩුවීම) | |
|---|---|---|---|---|
| | 2023 | 2022 | රු. | % |
| | රු. | රු. | | |
| මුළු වියදම | 71,544,975 | 77,015,260 | 5,470,285 | 07 |
| - කාර්ය මණ්ඩල පිරිවැය | 49,014,373 | 52,907,286 | | |
| - ගොඩනැගිලි කුලිය | | | | |
| මුළු වියදමේ ප්‍රතිශතය (%) | 68.5 | 69 | | |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වසර තුළදී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් (SBEs) 261කට අදාළ මූල්‍ය ප්‍රකාශන කට්ටල 252ක් සමාලෝචනය කිරීමට මණ්ඩලය සැලසුම් කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සැලැස්ම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 51කින් අඩු වී ඇති බව නිරීක්ෂණය විය. | සැළසුම් කරන අවස්ථාවේ දී ඍජුවම සමාලෝචනවලට සම්බන්ධ වීමට ඇති අඩු කාර්ය මණ්ඩල සංඛ්‍යාව සැලකිල්ලට ගනිමින්, වැඩ සැලැස්ම සංශෝධනය කරන ලදී. | මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සංඛ්‍යාව වැඩි කළ යුතු වීම. |

### 3.2 ව්‍යාපෘතිවල ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් මණ්ඩලයේ කාර්යාල පරිශ්‍රයේ අභ්‍යන්තර කටයුතු සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා උපදේශන සේවා වෙනුවෙන් සම්පූර්ණ ඉදිකිරීම් පිරිවැයෙන් සියයට 7 ක මුදලක් වන පිරිවැයක් යටතේ 2019 ජනවාරි 30 වැනි දින ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ ගිවිසුමක් ඇති කර ගෙන තිබුණි. ඉදිකිරීම් සංවර්ධන අදියර අවසන් කර 2021 ඔක්තෝබර් 27 දින උපදේශන බිල්පතෙන් සියයට 65 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, උපදේශන සේවාවල ඉතිරි වැඩ අදියර හෝ පරිශ්‍රයේ යෝජිත වැඩිදියුණු කිරීම් 2024 මැයි 31 වන විටත් අවසන් කර නොතිබුණි. | ඒ වන විට ක්‍රියාත්මක වූ රජයේ සීමාවන් හේතුවෙන් කාර්යාල පරිශ්‍රයේ සැලසුම් සහ අභ්‍යන්තර කටයුතු 2019 දී තාවකාලිකව නවතා දමන ලදී. තවද, 2021 දී ඉහත සීමාවන් හේතුවෙන් මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම, අවසන් කිරීමට නොහැකි විය.<br>2024 දී, සීමිත අයවැය ප්‍රතිපාදන සලකා බැලීමෙන් වැඩ නැවත ආරම්භ කිරීමට SLAASMB හට නොහැකි විය. | නියමිත කාලසීමාව තුළ කාර්යය සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පුරප්පාඩු 23ක් පැවතුණි. එයින් පුරප්පාඩු 20 ක් මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් බලපෑමක් සිදු කළ හැකි විධායක මට්ටමේ පුරප්පාඩු විය. තවද, පුරප්පාඩු වූ තනතුරු 20 න් නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර අධ්‍යක්ෂ මණ්ඩලය ආරම්භයේ සිටම | 2023 දී 2021 සංශෝධිත වැටුප් ව්‍යුහය අනුගමනය කළද, 2023 සහ ඉන් පසුව අවස්ථා කිහිපයකදී පුරප්පාඩු ප්‍රචාරය කිරීමෙන් පසුව වුවද සුදුසු අපේක්ෂකයින් බඳවා ගැනීමට SLAASMB හට නොහැකි විය. එබැවින්, සමාලෝචන ආවරණය අවශ්‍ය පරිදි වැඩි දියුණු කිරීම සඳහා නව කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමේ අවශ්‍යතාවය හේතුවෙන්, අධ්‍යක්ෂ | අනුමත කිරීම් ලැබීමෙන් පසුව, යෝග්‍ය කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට වහාම කටයුතු කළ යුතු වීම. |

පුරප්පාඩු වී තිබූ අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ අධීක්ෂණ සහ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරු 6ක් බඳවා ගෙන නොතිබුණි. තවද, 2023 දෙසැම්බර් 31 වන විට මූල්‍ය, පරිපාලන සහ තොරතුරු තාක්ෂණ අංශවල ප්‍රධානී තනතුරුද පුරප්පාඩු වී තිබුණි.

අධීක්ෂණ සහ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ යන තනතුරු දෙකටම අවශ්‍ය පළපුරුදු වසර ගණන අඩු කිරීමට මණ්ඩලය විසින් තීරණය කරන ලදී. එම සංශෝධනයෙන් පසුව, SLAASMB විසින් 2024 මාර්තු මාසයේදී එක් අධීක්‍ෂණ අධ්‍යක්ෂවරයෙකු සහ 2024 අප්‍රේල් මාසයේදී සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ - 2 ශ්‍රේණිය සඳහා තුන් දෙනෙකු බඳවා ගන්නා ලදී.

MIS අවසන් වෙමින් පවතින බැවින් සේවාවල හදිසි අවශ්‍යතාවය මත SLAASMB විසින් තොරතුරු තාක්ෂණ කටයුතු 2023 නොවැම්බර් මාසයේ සිට බාහිර උපදේශන සමාගමකට තාවකාලිකව ලබා දෙන ලදී. තනතුර පිරවීමේ දුෂ්කරතා හේතුවෙන් සහ තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවේ නිර්දේශ මත පදනම්ව, ඉහළ වැටුපකට කොන්ත්‍රාත් පදනම මත තොරතුරු තාක්ෂණ පරිපාලකවරයෙකු (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරියෙකු ලෙස නම් කර ඇත) බඳවා ගැනීමට මණ්ඩලය අනුමත කරන ලදී. ආකර්ශනීය වැටුපක් දැක්වීමේ ප්‍රතිඵලයක් ලෙසින් 2024 අප්‍රේල් සිට ක්‍රියාත්මක වන පරිදි සුදුසුකම් ලත් ICT නිලධාරියෙකු බඳවා ගැනීමට SLAASMB හට හැකි විය.